**10 ශ්‍රේණිය.**
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**දෙවෙනි වාරය - එකොළොස්වෙනි සතිය.**

<u>ක්‍රියාකාරකම.</u>

- ඔබගේ පෙළ පොතෙහි 89වන පිටුවෙහි ඇතුළත් ''කාව්‍ය නිර්මාණකරණය'' පාඩම හොඳින් කියවන්න.

- කාව්‍ය නිර්මාණයක අන්තර්ගත වන පහත යෙදුම් මොනවාදැයි පාඩම ඇසුරෙන් සොයා විස්තර කරන්න.
  - ප්‍රතිභාව
  - ව්‍යුත්පත්තිය
  - සතතාභ්‍යාසය
  - පරිකල්පනය
  - චමත්කාරය

- කාව්‍ය නිර්මාණයක් රසවත් කිරීමෙහිලා කවියකු විසින් යොදාගන්නා උපතක්‍රම කවරේදැයි මැනවින් අධ්‍යයනය කරන්න. එහිදී පහත කරුණු පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරන්න.
  - කවියා විසින් උපයුක්ත බස් වහර
    - සරල බසක්ද?
    - පණ්ඩිත ප්‍රිය භාෂාවක් ද?
    - සාමාන්‍ය ජනයා අතර පවතින ව්‍යවහාරික භාෂාවක් ද?
    - මිශ්‍ර භාෂාවක්ද?

  - සංකල්ප රූප භාවිතය

    සංකල්පරූප යනු පාඨක මනසෙහි චිත්තරූප ජනනය කිරීමයි. මේ සඳහා කවියකු භාවිත කරන උපක්‍රම කිහිපයකි.
    - උපමා
    - රූපක
    - උත්ප්‍රාස
    - උත්ප්‍රේක්ෂා
    - සංකේත

  පාඩම ඇසුරෙන් මේ එක් එක් යෙදුම සඳහා උදාහරණ සොයාගන්න.

- පාඩමේ හරය මැනවින් අවබෝධ කරගෙන ඔබගේ සිත්ගත් මාතෘකාවක් ඔස්සේ කාව්‍ය පන්තියක් නිර්මාණය කරන්න.

* * *

සැකසුම
ජගත් කුමාර ජයසිංහ
ගුරු උපදේශක
දෙහිඕවිට අධ්‍යාපන කලාපය